GENERAL
No.
Date:-
LIBRARY

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2008 අංක 16 දරන පරීක්ෂණ කොමිෂන් සභා (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2008 මාර්තු මස 05 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2008 මාර්තු මස 7 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

මිළ : රු. 7.00 යි.　　තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

## 2008 අංක 16 දරන පරීක්ෂණ කොමිෂන් සභා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2008 මාර්තු මස 05 වන දින]

එල්. ඩී.—ඕ. 17/2007.

(393 වන අධිකාරය වූ) පරීක්ෂණ කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 2008 අංක 16 දරන පරීක්ෂණ කොමිෂන් සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (393 වන අධිකාරය වූ) පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 393 වන අධිකාරයේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එහි (1) වන උපවගන්තියේ "පරීක්ෂණයක්" යන වචන වෙනුවට "විමර්ශනයක් හෝ පරීක්ෂණයක් නැතහොත් උචිත අවස්ථාවන්හි දී ඒ දෙකම" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එහි (1) වන උප වගන්තියේ (අ), (ආ) සහ (ඇ) ඡේද ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"(අ) ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක, යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයක, යම් රාජ්‍ය ආයතනයක හෝ පළාත් පාලන ආයතනයක හෝ වෙනත් යම් ආයතනයක පරිපාලනය, කළමනාකරණය සහ කර්තව්‍ය ;

(ආ) ව්‍යවස්ථාපිත මණ්ඩලයක, යම් රාජ්‍ය ආයතනයක හෝ පළාත් පාලන ආයතනයක හෝ වෙනත් ආයතනයක යම් රාජ්‍ය නිලධරයකුගේ හෝ සේවා නියුක්තයකුගේ ක්‍රියා කලාපය ; හෝ

(ඇ) ඔහුගේ මතය අනුව, අවස්ථාවෝචිත පරිදි, යම් විමර්ශනයක් සහ පරීක්ෂණයක් නැතහොත් යම් විමර්ශනයක් සහ පරීක්ෂණයක් යන දෙකම

2—PL 002599—3,500 (2007/11)

සම්බන්ධයෙන් වූ යම් කාරණයක් හෝ සිද්ධියක්, ජාතික යහපත හෝ මහජන ආරක්ෂාව හෝ සුභ සාධනය සඳහා වේ ද එම කාරණය හෝ සිද්ධිය ;";

(3) එහි (1) වන උපවගන්තියේ "පරිපාලනය, ක්‍රියා කලාපය හෝ කාරණය පිළිබඳව පරීක්ෂාකොට වාර්තා කිරීම සඳහා" යන වචන වෙනුවට, "අවස්ථාවෝචිත පරිදි විමර්ශනය කිරීමට හෝ පරීක්ෂා කිරීමට නැතහොත් විමර්ශනය සහ පරීක්ෂා කිරීම යන දෙකම සිදු කිරීමට සහ පරිපාලනය , කළමනාකරණය, කර්තව්‍ය, ක්‍රියා කලාපය, කාරණය හෝ සිද්ධිය පිළිබඳව වාර්තා කිරීමට" යන වචන ආදේශ කිරීමෙන් ;

(4) එහි (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්ති එකතු කිරීමෙන් :—

"3. (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද අධිකාර පත්‍රයක් මගින් පත් කරන ලද කොමිෂන් සභාවේ සාමාජිකයකු-

(අ) තම ධුරය අනිසි ලෙස ප්‍රයෝජනයට ගෙන හෝ අයථා ලෙස ප්‍රයෝජනයට ගෙන ඇති බවට හෝ මේ පනත මගින් හෝ කොමිෂන් සභාව පත් කරනු ලැබූ අධිකාර පත්‍රය මගින් පවරන ලද බලතල අයථා ලෙස පාවිච්චි කර ඇති බවට;

(ආ) අල්ලස් හෝ දූෂණ ක්‍රියාවල නියැලී ඇති බවට; හෝ

(ඇ) මානසික හෝ ශාරීරික දුබලතාවයකින් පෙළෙන බවට,

ජනාධිපතිවරයා සෑහීමට පත් වන්නේ නම් පමණක්, එම සාමාජිකයා ඉවත් කරනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය ප්‍රකාරව සාමාජිකයකු ඉවත් කරනු ලැබීමේ දී, ජනාධිපතිවරයා විසින් එම කරුණ

පිළිබඳව වහාම පාර්ලිමේන්තුව වෙත වාර්තා කළ යුතු අතර, එම සාමාජිකයා ඉවත් කිරීම සඳහා වූ හේතු එහි සඳහන් කළ යුතු ය.

(5) කොමිෂන් සභාව සාමාජිකයන් එක් අයෙකුට වැඩි ගණනකින් සමන්විත වන අවස්ථාවක, කොමිෂන් සභාවේ සභාපතිවරයා ද ඇතුළත් විය යුතු පැමිණ සිටින සාමාජිකයන්ගේ මුළු සංඛ්‍යාවෙන් හරි අඩකට අඩු නොවන සංඛ්‍යාවක් විසින් කොමිෂන් සභාවේ සාමාජිකත්වයේ යම් පුරප්පාඩුවක් තිබීම නොතකා මේ පනත යටතේ කොමිෂන් සභාවේ බලතල ක්‍රියාත්මක කළ හැකි ය.

(6) විරුද්ධ මත පළකිරීම් ඇත්නම් ඒවා ද ඇතුළුව, කොමිෂන් සභාවේ සියලුම සාමාජිකයන්ගේ මත පළකිරීම් කොමිෂන් සභාවේ වාර්තාවල අන්තර්ගත විය යුතු අතර, කොමිෂන් සභාවේ සාමාජිකයකු මිය යන, ඉල්ලා අස්වන, කොමිෂන් සභාවෙන් නිදහස් කිරීමට අදහස් කරනු ලබන, එම වාර්තාවේ තම අත්සන තැබීමට ප්‍රතික්ෂේප කරන අවස්ථාවක දී හැර හෝ කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස ක්‍රියා කිරීමට ප්‍රතික්ෂේප කරන හෝ නොහැකි වන අවස්ථාවක දී හැර සියලුම සාමාජිකයන් විසින් එම වාර්තාවට අත්සන් තැබිය යුතු ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරනු ලැබේ:— *(ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.)*

*("අධිකාරිපත්‍රය වෙනස් කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම.)* 5. ජනාධිපතිවරයා විසින්, මේ පනත යටතේ නිකුත් කරනු ලද යම් අධිකාරී පත්‍රයක් කවර හෝ අවස්ථාවක දී වෙනස් කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම කරනු ලැබිය හැකි ය.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ:— *(ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.)*

(1) එම වගන්තිය (1) වන උපවගන්තිය ලෙස නැවත අංක යෙදීමෙන් ;

(2) නැවත අංක යෙදූ ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් :—

"(ආආ) යම් නඩුවක, නඩු වාර්තාවල සහතික පිටපත්, යම් ලේඛනයක් හෝ එම ලේඛනයේ සහතික පිටපතක් හෝ යම් අධිකරණයක හෝ විනිශ්චය අධිකාරියක ගොනුකර ඇති හෝ වාර්තාගත කර ඇති වෙනත් යම් ලේඛනයක් ලබා ගැනීම සඳහා එම අධිකරණයට හෝ එම විනිශ්චය අධිකාරයට ඉල්ලීමක් කිරීම;

(ආආආ) යම් තැනැත්තකුගේ සන්තකයේ හෝ භාරකාරත්වය යටතේ ඇති යම් ලේඛනයක්, එහි සහතික පිටපතක් හෝ වෙනත් යම් ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස එම තැනැත්තාට නියම කිරීම;

(ආආආආ) යම් තැනැත්තකුගේ සන්තකයේ තිබීමට හැකියාවක් ඇති යම් තොරතුරක් පිළිබඳව ලිඛිතව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලෙස එම තැනැත්තාට නියම කිරීම.".

(3) ඒ වගන්තියේ නැවත අංක යෙදූ (1) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්:—

"(2) මේ පනත යටතේ පත් කරන ලද කොමිෂන් සභාට වෙත නිකුත් කරන ලද යම් අධිකාර පත්‍රයක් ප්‍රකාරව යම් වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක දී, පරීක්ෂණයේ හෝ විමර්ශණයේ විෂය වස්තුව වී ඇති යම් තැනැත්තකුගේ හෝ විමර්ශණය කිරීමට හෝ පරීක්ෂා කිරීමට එම කොමිෂන් සභාවට බලය පවරා ඇති කාරණයකට සම්බන්ධ වී ඇති හෝ ඊට අදාළ තැනැත්තකුගේ ක්‍රියා කලාපය සම්බන්ධයෙන් ගත යුතු බවට කොමිෂන් සභාව විසින් සලකනු ලබන ක්‍රියා මාර්ගය පිළිබඳව එම කොමිෂන් සභාව විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියට 23, 24, 25 සහ 26 වන වගන්ති ඇතුළත් කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා එම ප්‍රඥප්තියේ 23, 24, 25 සහ 26 වන වගන්ති ලෙස බලාත්මක විය යුතු ය:—

"විමර්ශන හෝ පරීක්ෂණවල දී රජයේ නිලධරයන්ගේ සහය ලබාදීම.

23. යම් කාරණයක් හෝ සිද්ධියක් පිළිබඳව විමර්ශනයක් හෝ පරීක්ෂණයක් නැතහොත් විමර්ශනය සහ පරීක්ෂණය යන දෙකම පවත්වන ලෙස මේ පනත ප්‍රකාර පත් කර ඇති පරීක්ෂණ කොමිෂන් සභාවක් වෙත, ජනාධිපතිවරයා විසින් නියම කර ඇති අවස්ථාවක, එම කොමිෂන් සභාව වෙත පවරා ඇති බලතලවල කුමක් සඳහන් වුව ද, කොමිෂන් සභාවේ විධාන සහ අධීක්ෂණය යටතේ යම් කාරණයකට හෝ සිද්ධියකට අදාළව කොමිෂන් සභාව විසින් තෝරාගත් යම් රාජ්‍ය නිලධරයකුගේ සහය, අදාළ පත්කිරීමේ අධිකාරියේ එකඟත්වය ඇතිව ලබා ගැනීමට ද, එම නිලධරයා හරහා එම කාරණය හෝ සිද්ධියට අදාළ විමර්ශන පැවැත්වීමට කටයුතු සැලැස්වීම සඳහා ද කොමිෂන් සභාවට හිමිකම් ඇත:

එසේම තවදුරටත්, යම් විමර්ශනයක් තුළ දී එකතු කර ගන්නා ලද ලිපි ලේඛන කොමිෂන් සභාව විසින් පරීක්ෂා කොට එම කාරණය හෝ සිද්ධිය පිළිබඳව ස්වභාවික යුක්තියේ රීති අනුගමනය කරමින් පරීක්ෂා කර ඇත්නම් මිස, විමර්ශනය කරන ලද එම කාරණය හෝ සිද්ධිය පිළිබඳව කොමිෂන් සභාව විසින් යම් තීරණයකට නොඑළඹිය යුතු ය.

අපරාධ නඩු පැවරීම.

24. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ හෝ වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වුවද, මේ පනත යටතේ පත් කරන ලද පරීක්ෂණ කොමිෂන් සභාවක් විසින්, අවස්ථාවෝචිත පරිදි පවත්වන ලද විමර්ශනයක දී හෝ පරීක්ෂණයක දී හෝ එම විමර්ශනය සහ පරීක්ෂණය යන දෙකේ දීම ලබාගත් තොරතුරු මත පදනම්ව යම් වරදක් සම්බන්ධයෙන් නීතිපතිවරයා විසින් යම් අධිකරණයක දී අපරාධ නඩු කටයුතු පැවරීම නීත්‍යානුකූල වන්නේය.

කොමිෂන් සභාව විසින් රීති සෑදිය හැකි බව.

25. (1) මේ පනතේ සහ වෙනත් යම් නීතියක විධිවිධානවලට යටත්ව අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, මේ පනත යටතේ පත් කරන ලද පරීක්ෂණ කොමිෂන් සභාවක සංවිධානාත්මක ව්‍යුහය, උපකාරක ව්‍යුහයන්හි මැන්ඩේට් බලපත්‍ර, කොමිෂන් සභාවේ නිළධරයන්ගේ කර්තව්‍යවලට අදාළ රීති සෑදීමේ බලතල කොමිෂන් සභාවට තිබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතිවලට යටත්ව කොමිෂන් සභාව එම රීතිවලින් පාලනය විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීති කොමිෂන් සභාව විසින් කලින් කළ සංශෝධනය කරනු ලැබිය හැකි ය.

(4) ප්‍රායෝගිකව හැකි පහසු ඉක්මණින් කොමිෂන් සභාව විසින් සාදනු ලබන රීති ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.".

නීතිපතිවරයාගේ බලතල.

26. (1) මේ පනතේ විධිවිධාන යටතේ පරීක්ෂණයක් හෝ විමර්ශණයක් පැවැත්වීමේ දී නීතිපතිවරයාට-

(අ) යම් කොමිෂන් සභාවක් ඉදිරිපිට පෙනී සිටිය හැකි ය;

(ආ) අවස්ථාවෝචිත පරිදි, අදාළ විමර්ශණයේ දී හෝ පරීක්ෂණයේ දී නීතිපතිවරයාගේ මතයට අනුව අදාළ වන සාක්ෂි කිසිවක් කොමිෂන් සභාව හමුවට ඉදිරිපත් කළ හැකි ය;

(ඇ) කොමිෂන් සභාව විසින් කැඳවන ලද යම් සාක්ෂිකරුවකුගේ සාක්ෂි, අවස්ථාවෝචිත පරිදි, ඒ විමර්ශණයට හෝ පරීක්ෂණයට වැදගත් වන බවට හෝ එමගින් අදාළ තොරතුරු හෙළිදරව් වී ඇති බවට නීතිපතිවරයාට පෙනී යන්නේ නම්, ඒ සාක්ෂිකරු පරීක්ෂා කළ හැකි ය.

(2) කොමිෂන් සභාව විසින් වාර්තාගත කරන ලද සියලු ප්‍රකාශ සහ සාක්ෂිවල පිටපත් සහ අවස්ථාවෝචිත පරිදි, එම පරීක්ෂණය හෝ විමර්ශණය පවත්වන අතරතුර දී කොමිෂන් සභාව විසින් ලබාගත් හෝ ඊට ලැබුණ වෙනත් යම් ලේඛන, නීතිපතිවරයා විසින් කරනු ලබන ඉල්ලීමක් මත, කොමිෂන් සභාව විසින් නීතිපතිවරයා වෙත ලබාදිය යුතු ය.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**6.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රධාන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව පළෙවන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.